කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

11 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව I කොටස | කාලය පැය 03 යි

**සැලකිය යුතුයි.**

i. සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ** පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්ණය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( x) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා පිළිපදින්න.

---

- **පහත දැක්වෙන පදය හා දෙබස් ඛණ්ඩ කියවා 1 සිට 4 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - අත්තක පිපි මලක් ලෙසේ
පෙත්තක ඇදි රුවක් ලෙසේ
සත්තක මගෙ පුතුනි යසේ
නෙත් දෙක හැර බලන් මෙසේ

B - බමුණු - බාසායං අත්ථි
ඇදුරා - බස් යන්නේ මේ පාරෙන් නෙමේ කන්දෙන් එහා පැත්තේ

C - පෙරසිට පැවත එන
සිරිතට පොදිය බැදගෙන

D - ඇන්නැවේ මේ මල කෝලං
පාරේ යන්නට බෑ මුන්දෑ සමගින්

01). ඉහත A පදා අයත් වන ශාන්ති කර්මය වනුයේ ,

(1). දෙවොල් මඩුවයි. (2). රට යකුමයි.
(3). සුනියම් යාගයයි. (4). මහ සොහෙන් සමයමයි.

02). අනවින කොඩිවින හදි හූනියම් වලින් මිදීමට පවත්වන ශාන්ති කර්මය හා සම්බන්ධ වන්නේ,

(1). A ය. (2). B ය. (3). C ය. (4). D ය.

03). මහා සම්මත රජුගේ බිසවගේ දොලදුක සංසිදවීම වෙනුවෙන් පැවැත්වූ නාටකයක පදා ඛණ්ඩය වනුයේ,

(1). A ය. (2). B ය. (3). C ය. (4). D ය.

04). ඉහත D හි සඳහන් පදා සඳහා සංගීතය නිර්මාණය කිරීමට අභාසය ලබා ගත්තේ,

(1). කෝලම් වලිනි (2). නාඩගම් වලිනි.

(3). දේශිය ජන සංගීතයෙනි (4). උත්තර භාරතීය රාගධාරි සංගීතයෙනි.

05). පහත සඳහන් කියමන් අතරින් නාට්‍ය කලාවට සම්බන්ධ නිවැරදි කියමන තෝරන්න.

A - රංග කාලය හා අවකාශය සීමා සහිතය.

B - ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබේ.

C - නැවත නැවත නිර්මාණය වෙනස් කල නොහැක.

D - එක් වේලාවක එක් ස්ථානයක පමණක් ප්‍රදර්ශනය කෙරේ.

(1). ACD (2). ABD (3). ABC (4). BCD

06). අනුශාංගික කලා ප්‍රභේද වන්නේ,

(1). වේෂ භූෂන, රංගාලෝකය, සමීප රූප, ගමන්තාල

(2). අංග රචනය, පසුතල දර්ශනය, රූපණ රටා, සමීප රූප.

(3). නර්තනය, රූපනය, සංගීතය, ගමන්තාල

(4). අංග රචනය, රංග භාණ්ඩ, රංගාලෝකය, වේෂ භූෂන

07). එක් ශිෂයෙක් තවත් ශිෂයෙක් සමඟ ඇස් වලින් පවත්වන සම්බන්ධතාවය ඍජුව පවත්වාගෙන යාමට අපොහොසත් වේ. මෙම දුර්වලතාවය මඟ හරවා ගැනීමට සුදුසුම රංග අභ්‍යාසය වන්නේ,

(1). දර්පන අභ්‍යාසයයි. (2). ශිථිලකරන අභ්‍යාසයයි.

(3). රංග ක්‍රීඩායි. (4). කටහඬ අභ්‍යාසයයි.

08). ස්වාභාවික චලන යනු,

(1). පරිකල්පන භාවිතා කරමින් කරන චලන වේ.

(2). තම ශරීරය නිරෝගීව පවත්වා ගැනීමට කරන චලන වේ.

(3). එදිනෙදා ජීවිතයේදී ආයාසයකින් තොරව කරනු ලබන චලන වේ.

(4). අනුකරණාත්මකව කරනු ලබන චලන වේ.

09). අනුකරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1). නිරීක්ෂණයෙන් තොරව ඉදිරිපත් කිරීමයි.

(2). පරිකල්පනය කරගත් රූපය නිර්මාණය කිරීමයි.

(3). චරිතයට ප්‍රවේශ වීම හෙවත් ආරූඪ වීමයි.

(4). පුද්ගල චරිතයක් ක්‍රියාවක් හා අවස්ථාවක් ඒ අයුරින්ම කර පෙන්වීමයි.

10). නාට්‍යක ගැටුම සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

(1). ගැටුමක් නොමැති තැන නාට්‍යක් නොමැත.

(2). ගැටුම නිසා කුතුහලය හා ආතතිය ඇති වේ.

(3). ගැටුම නිසා ප්‍රේක්ෂකයා තුළ රසයක් ජනනය වේ.

(4). ගැටුම නිසා නාට්‍යයේ රසය හීන වේ.

11). අභිරූපනය සම්බන්ධයෙන් නොගැලපෙන පිළිතුරු වන්නේ,

(1). ආංගික අභිනය මූලික කරගෙන වාචික අභිනයෙන් තොරව සිදු කිරීමයි.

(2). අතිශෝක්තියෙන් යුත් නිරූපනයකි.

(3). දෙබස් හා සංවාද සහිත පෙලක් ඇත.

(4). සුවිශේෂී අංග රචනයක් දැකිය හැකිය.

12). යම් චරිතයක් ප්‍රේක්ෂකයා හමුවේ මැනවින් නිරූපණය කිරීම පිණිස රූපන ශිල්පියා,

(1). රංග අභ්‍යාස හා ක්‍රීඩා මැනවින් ප්‍රගුණ කළ යුතුය.

(2). මනා කඩවසම් හෝ රූමත් අයකු විය යුතුය.

(3). පිටතට අධ්‍යනය කර චරිතයේ භූමිකා හඳුනා ගත යුතුය.

(4). පරිකල්පන හැකියාව මත චරිතයේ භූමිකා වෙනස් විය යුතුය.

13). පහත සඳහන් නාට්‍ය අතුරින් ලෝකධර්මී සම්ප්‍රදායට අනුව නිශ්පාදනය වූ නාට්‍ය කුමක්ද?

(1) සිංහබාහු (2). මනමේ

(3). මහාසාර (4). කැළණි පාලම

14). වේදිකා නාට්‍යයක නැතුවම බැරි දෙදෙනා වන්නේ,

(1). නිශ්පාදක හා අංග රචනා ශිල්පියා

(2). පෙළ රචක හා අර්ථපතිය

(3). රංගාලෝක ශිල්පියා හා වේෂ භූෂණ ශිල්පියා

(4). නළුවා හා ප්‍රේක්ෂකයා.

15). මනමේ නාට්‍ය සඳහා පදනම් වූ කතා ප්‍රවෘත්තිය තෝරා ගෙන ඇත්තේ,

(1). චුල්ල ධනුද්දර ජාතකයෙනි.

(2). උම්මග්ග ජාතකයෙනි.

(3). මහා භාරතයෙනි.

(4). මහාවංශයෙනි.

- **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/ අනුවර්තනය | මෙරට නිශ්පාදනය |
|---|---|---|---|
| ද බ්‍රැගන් | එව්ගිනි ජ්වාට්ස් | මකරාක්ෂ | ක |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනිසි විලියම්ස් | ග | හෙන්රි ජයසේන |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | ජ | හිත හොඳ අම්මන්ඩි | සුගතපාල ද සිල්වා |
| ට | ගාර්ෂියා ලෝකා | මූදු පුත්තු | ගුනසේන ගලප්පත්ති |

16). ඉහත වගුවේ 'ක' වගුවට ඇතුලත් විය යුතු මෙරට අධ්‍යාක්ෂකගේ නම කුමක්ද?

(1). විජිත ගුණරත්න (2). ධර්මසිරි බණ්ඩාරනායක

(3). සුගතපාල ද සිල්වා (4). රංජිත් ධර්මකීර්ති

17). ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුලත් විය යුතු නාට්‍ය යේ නම කුමක්ද?

(1)අහස් මාලිගා (2). වීදුරු බඳුන

(3). සුබ සැන්දෑවක් (4). පලිඟු බෝනික්කෝ

18). ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුලත් විය යුතු රචකයා කවුද?

(1). නිකලෝයි ගොගොල් (2). බර්නාඩ් ෂෝ

(3). බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (4). ඇන්ටන් චෙකෝෆ්

19). ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුලතු විය යුතු නාට්‍යයේ නම කුමක්ද?

(1). යෙර්මා (2). ද එල්ඩර් සන්

(3). වෙරි වත්ත (4). ද පබ්ලික් එනමි.

20). නාට්‍යයක් සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

(1). නාට්‍යක් නිශ්පාදනය කිරීමට පෙර ප්‍රසිද්ධ රැගුම් පාලක මන්ඩලයෙන් අවසර ලබා ගත යුතුය.

(2). නාට්‍යක් නිශ්පාදනය කරන්නේ ප්‍රොසිනියම් වේදිකාවක රඟ දැක්වීමටය.

(3). නාට්‍යක් මඟින් ප්‍රේක්ෂකයාට පණිවිඩයක් ලබා දිය යුතුය.

(4). නාට්‍යක් නිශ්පාදනය යනු කේවල ක්‍රියාවක ප්‍රතිඵලයකි.

- **නිවැරදි පිළිතුරු තෝරන්න.**

21). විකෘති වේදිකා නාට්‍යයේ තේමාව වන්නේ,

(1). වැඩිහිටියන්ගේ අපේක්ෂාවන්ට අනුගතව බාල පරපුර සතු සිතුම් පැතුම් හා අපේක්ෂාවන් බිලි දීමයි.

(2). වන යොවුන් වියේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනයේ තීරක බලය දෙමාපියන් සතු විය යුතු බවයි.

(3). පාසල් අධ්‍යාපනය මෙන්ම පෞද්ගලික අධ්‍යාපනය ලැබීමටද දරුවන් යොමු විය යුතු බවයි.

(4). රටට හා ජාතියට ලැදි දරුවෙකු ගොඩ නගා ගැනීමට දෙමාපියන් අවධාරනය කළ යුතු බවයි.

22). ක්ෂනික නිරූපනය යනු,

(1). ක්ෂනිකව සකසා ගත් පිටපතක් මත ඉදිරිපත් කරන්නකි.

(2). නිර්මානාත්මක චින්තනය හා හැකියාව මත වේදිකාවේ ඉදිරිපත් කරනු ලබන්නකි.

(3). පිටපතකින් තොරව සීමිත කාලයකදී යම් කිසි අවස්ථාවක් නිරූපනය කරන්නකි.

(4). නිර්මානාත්මතක චින්තනය හා හැකියාව ඇති පාසල් සිසුන් විසින් ඉදිරිපත් කරනු ලබනනකි.

23). පින්තූර රාමු වේදිකාවේ කල්පිත බෙදීමේ කොටස් කීයද?

(1). හතරයි. (2). නවයයි.

(3). හයයි. (4). අටයි.

24). කපු යක්කාරිය හා දරුනැලවිල්ල දක්නට ලැබෙන දේශිය ශාන්ති කර්මය වනුයේ,

(1). කොහොඹා කංකාරිය (2). සුනියම් ශාන්ති කර්මය

(3). මංගර මඩුවයි (4). රට යකුම හෙවත් රිද්දි යාගයයි.

25). රංග භූමියේ ක්‍රමික විකාශනයේ අනුපිළිවෙල වන්නේ,

(1). ප්‍රොසිනියම් වේදිකාව, කරලිය, තානායම් පොළ, කමත.

(2). ප්‍රොසිනියම් වේදිකාව, කරලිය, කමත, තානායම් පොළ.

(3). කමත, තානායම් පොළ, කරලිය, ප්‍රොසිනියම් වේදිකාව

(4). තානායම්පොල, කමත, කරලිය, ප්‍රොසිනියම් වේදිකාව.

26). නාට්‍යක් රංග ගත කරවන මොහොතේදී දර්ශනයෙන් දර්ශනයට පසුතල මාරු කිරීම මෙහෙයවන්නේ,

(1). අධ්‍යක්ෂකවරයාය.

(2). වේදිකා පරිපාලකයාය.

(3). පසුතල හා රංග භාණ්ඩ සැලසුම් කරුය.

(4). රංග වින්‍යාස ශිල්පියාය.

27). මහ මුහුදට නැව ඇවිත් බසින්නේ
මහ මුහුදේ නැව ගමනි බොලන්නේ
ගොළු මුහුදට නැව ඇවිත් බසින්නේ
ගොළු මුහුදේ නැව ගමනි බොලන්නේ

මෙම පදය අයත් ගැමි නාටකය වන්නේ,

(1). නාඩගම් ය. (2). නුර්ති ය.

(3). සොකරි ය. (4). කෝලම් ය.

28). රංගාලෝකය සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,

(1). නාට්‍ය අලංකාර කිරීමට ඉවහල් වේ.

(2). නළුවන් පැහැදිලිව දැක ගැනීමට උපකාරී වේ.

(3). දර්ශනයන් ඉස්මතු කිරීමට උපකාරී වේ.

(4). යම් දර්ශනයක් දැක්වෙන කාලය පෙන්වීමට ඉවහල් වේ.

29). ලෝක ධර්මී නාට්‍යක ලක්ෂණයක් සේ සැලකෙන්නේ.

(1). යථාර්තය ඒ ලෙසටම වේදිකාව මත ඉදිරිපත් කිරීමයි.

(2). අතිශෝක්තියට නගා රූපනය ඉදිරිපත් කිරීමයි.

(3). වේදිකා අලංකරණ අතිශෝක්තියෙන් දැක්වීමයි.

(4). ස්වාභාවිකත්වයට ආසන්න ස්වරූපයෙන් වේදිකාව මත ඉදිරිපත් කිරීමයි.

30). නළුවරණය යනු,

(1). රංගනය සඳහා සුදුසු ආනුශාංගික ශිල්පින් තෝරා ගැනීමයි.

(2). අධ්‍යක්ෂවරයා චරිත වලට උචිත නළු නිලියන් තෝරා ගැනීමයි.

(3). අධ්‍යක්ෂක රංග භූමිය සැලසුම් කිරීමයි.

(4). නළු නිලියන් චරිතවලට සමාරෝපනය වීම.

31). මින් නෘත්‍ය ගනයට අයත් වන්නේ,

(1). රාධා ක්‍රිෂ්නා නර්තනය, වඩිග පටුන, නානුමුරය.

(2). ලී කෙලි, ශුද්ධ මාත්‍රා, වඩිග පටුන.

(3). වඩිග පටුන, නානුමුරය, සවරං නැටුම.

(4). ශුද්ධ මාත්‍රා, සවරං නැටුම, ලී කෙලි නැටුම.

32). නාට්‍ය පෙලක් රචනා කිරීමේදී ,

(1). චරිත පැහැදිලි ලෙස අර්ථකතනය විය යුතුය.

(2). අදාල රංග විධාන ලියා තිබිය යුතුය.

(3). ලිඛිත භාෂා භාවිතා කළ යුතුය.

(4). සංවාද භාවිතය මූලික වේ.

- **පහත දැක්වෙන වගුව ඇසුරින් 33 සිට 36 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| සූනියම් යක්ෂනියගේ පැමිනීම | මරා ඉපැද්දීම | සන්නිකුම | සොකරි |
| කඩවක් තරනය | අඹ විදමන | සූනියම් යාගය | කෝලම් |
| පැදුරු දැපවිල්ල | රාම මැරීම | රිද්දි යාගය | නාඩගම් |

33). දේශීය ගැමි නාටකය ඇතුලත් කාන්ඩය වන්නේ,

(1). A ය. (2). B ය. (3). C ය. (4). D ය.

34). ගම් මඩුවෙහි එන නාට්‍යමය පෙලපාලිය අයත් කාන්ඩය වන්නේ,

(1). A ය. (2). B ය. (3). C ය. (4). D ය.

35). මෙහි පහතරට ශාන්ති කර්මය අයත් කාන්ඩය,

(1). A ය. (2). B ය. (3). C ය. (4). D ය.

36). දහ අට සන්නියේ නාට්‍යමය අවස්ථා ඇතුලත් කාන්ඩය,

(1). A ය. (2). B ය. (3). C ය. (4). D ය.

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් 37 – 40 දක්වා ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**



**E**



**F**

37). E රූපයේ දැක්වෙන්නේ,

(1). ස්පොට් ලයිට් (2). බැටින් ලයිට්

(3). ෆලඩ් ලයිට් (4). ඩීමරය

38). F රූපයේ දැක්වෙන්නේ,

(1). ස්පොට් ලයිට් (2). බැටින් ලයිට්

(3). ෆලඩ් ලයිට් (4). ඩීමරය



A



B

39). ටවර් හෝල් නාට්‍ය රංගනයේ ප්‍රකට වූ චරිතය,

(1). රුක්මණී දේවී (2). අයිරාංගනී සේරසිංහ

(3). සෝමලතා සුබසිංහ (4). මාධනී මල්වත්ත

40). ඉංග්‍රීසි හා සිංහල වේදිකා නාට්‍ය සඳහා රංගන දායකත්වය දුන් නිලිය වන්නේ,

(1). රුක්මණී දේවී (2). සෝමලතා සුබසිංහ

(3). අයිරාංගනී සේරසිංහ (4). මාධනී මල්වත්ත

## II කොටස

**පළවැනි ප්‍රශ්ණය හා තවත් ප්‍රශ්ණ හතරක් ඇතුළු ව ප්‍රශ්ණ 5 කට පිළිතුරු සපයන්න.**

01). පහත දැක්වෙන සංවාද ඛන්ඩය කියවා අසා ඇති ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

දික්පිටිය :- මේ ගඟේ ඉන්න කිඹුල්ලුන්, මෝරුන් මගේ හොඳම මිතුරෝ. උන්ගෙන් මට කිසිදු උපද්‍රවයක් සිදු නොවේ.

කාලගෝල :- අනේ වාසනාවන් මේ සකියාට තව තවත් මිත්‍ර සම්පත් ලැබේවා. අනේ අපවත් මේ දියෙන් එගොඩ කරන්න.

දික්පිටිය :- උදේ පටන් ඇණ තියාගෙන ඉඳි මට බොහොම තෙහෙට්ටුයි. බිලී බැමෙනුත් කිසිම වාසියක් නැහැ නොවැ.

දිත්තල :- අපි ළඟ රස කැවුම් තියෙනවා.

කාලගෝල :- එයින් පංගුවක් ඔහෙටත් දෙනවා.

(දික්පිටිය ගඟ ගැඹුරු බව දක්වමින් ගඟෙන් එගොඩ වෙයි)

දික්පිටිය :- හොඳයි පලමුවෙන් කියනවා මේ දෙන්නාගෙන් මුලින් එගොඩ වන්නේ කවුද කියලා?

කාලගෝල :- මේ ඇත්ති මා විසින් සත් අවුරුද්දක් කඹුට මෙහෙවර කොට ලබා ගත් මගේ බිරින්දැයි.

දික්පිටිය :- හරි පුදුම කතාවක් නොවැ. කඹුර මෙහෙවර කොට ගෑනු ගන්නත් පුළුවන් රටක්ද මේක.

කාලගෝල :- ඇයි ඕයි පුදුම වෙන්නේ. කුස ජාතකයේ කුස රජ්ජුරුවොත් මං වගේ වීර ක්‍රියාවක් කළ අයෙක් බව

තමුසේ අහලා නැද්ද?

දික්පිටිය :- පොත පතේ මිස කුස පබාවතීලා අප අතර කොයින්ද? ඇරත් මේ ගගෙන් එගොඩ වෙන්න බැරි තමුසේ ලඟ ඇති වීර කම මොකක්ද? හොදයි කවුද පලමුවෙන් එගොඩ කරන්නේ.

(1). ඉහත සඳහන් දෙබස් ඇතුලත් නාට්‍යයේ පෙළ රචකයා කවුද? (ලකුණු 02)

(2). එම නාට්‍යය පෙළ රචනා කිරීම සඳහා පදනම් වූ මූල බීජය කුමක්ද? (ලකුණු 02)

(3). මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුම කුමක්ද? (ලකුණු 02)

(4). මෙහි වරහන් තුළ දැක්වෙන රංගනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන අභිනය කුමක්ද?

(ලකුණු 02)

(5). මෙහි එන දික්පිටිය වෙහෙසට පත්ව සිටින්නේ ඇයි? (ලකුණු 02)

(6). මෙම සංවාද අවසානයේ පැන නගින ගැටළුව කුමක්ද? (ලකුණු 02)

(2)

i. ප්‍රාසාංගික කලාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. නාට්‍ය හැර සෙසු ප්‍රාසාංගික කලා 4ක් නම් කරන්න. (ලකුණු 04)

iii. සෙසු ප්‍රාසාංගික කලාවන්ට වඩා නාට්‍ය කලාවේ ඇති විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(3).

i. නාට්‍යක් ගොඩ නැගීමේ කාර්යයේ ප්‍රමුඛයා කවුද? (ලකුණු 02)

ii. වේදිකා නාට්‍යක් සඳහා යොදා ගන්නා අනුශාංගික කලා පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. ඔබට වේදිකා නාට්‍යක් වේදිකා ගත කිරීමේ කාර්යය පැවරුනහොත් ඔබ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල අනුපිලිවෙලින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(4).

i. නාට්‍ය ශෛලිය යනු කුමක්ද? (ලකුණු 02)

ii. ප්‍රධාන රංග ශෛලීන් ද්විත්වය දක්වා උදාහරණ දෙක බැගින් දක්වන්න. (ලකුණු 04)

iii. එම නාට්‍ය ශෛලීන් ද්විත්වයේ වෙනස්කම් සතර අභිනය ඇසුරින් දක්වන්න. (ලකුණු 06)

(5).

i. පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත ප්‍රධාන ශාන්තිකර්ම 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. එම ශාන්ති කර්ම පැවැත්වීමේ අරමුණු වෙන් වෙන්ව සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ඔබ සඳහන් කළ එක් ශාන්ති කර්මයක එක් නාට්‍යය අවස්ථාවක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(6).




i. ඉහත රංග භූමිය අයත් ගැමි නාටකය නම් කරන්න (ලකුණු 02)

ii. මෙම ඡායාරූපයේ A, B, C, D නම් කරන්න. (ලකුණු 04)

iii. ඉහත කී ගැමි නාටකයේ විශේෂ ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 06)

**7).පහත දැක්වෙන කථා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.**

එක් හාවෙක් කැලෑවක ඇවිදිමින් යන විට මහත් වෙහෙසකට පත්විය. හාවාට හොඳටම බඩගින්නක් ඇති වී කෑමට යමක් සොයමින් කැලෑව ඇතුළට රිංගුවේ ය. කැලෑව ඇතුළින් සිංහයෙකුගේ විලාපයක් හාවාට ඇසුණි. හාවා විමසිල්ලෙන් බලමින් යන විට උගුලකට හසු වී සිටි සිංහයෙකු දැක්කේ ය. සිංහයා ඌව බේරාගන්නා ලෙස හාවාගෙන් ඇයද සිටියේ ය. .... එතැන් සිට

(1). නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා. (ලකුණු 04)

(2). සංවාද, රංග විධාන සහිතව වේදිකාවට ගැලපෙන පරිදි පෙළ නිර්මාණය සඳහා. (ලකුණු 08)